12782

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2015
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ...................................................................................... විභාග අංකය :- ..........................

සැළකිය යුතුයි. I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

## I කොටස

1. ජෛව ස්කන්ධයකට උදාහරණයකි.
   1.දර 2.ගල් අඟුරු 3.බොරතෙල් 4.පෙට්‍රෝලියම් වායු

2. පාරදෘශ්‍ය මාධ්‍යයකි.
   1. තෙල් කඩදාසි 2. මල් වීදුරු 3. පිරිසිදු ජලය 4. මීදුම

3. වර්ධනය අසීමිතව සිදුවන ජීවියා වන්නේ ,
   1. කළුවර ශාකය ය. 2. බල්ලා ය. 3. බළලා ය. 4. සිංහයා ය.

4. නොගැලපෙන සම්බන්ධය ඇති පිළිතුර තෝරන්න.
   1.සමනලයා → උරා බීම 2.බල්ලා → විකා ගිලීම
   3.මදුරුවා → විද උරා බීම 4.නයා → විකා ගිලීම

5. සරත් කුඩා හිස් ප්ලාස්ටික් ගම් බෝතලයකට ජලය අඩක් පමණ දමා ජල කඳ උස් පහත් කරමින් බෝතලයේ කටට මුඛය තබා පිඹින ලදී. ළමුන් සැවොම ඔහු දෙස හැරී බැලුවේ පහත වූ කුමන සතෙකුගේ කට හඬට සමාන හඬක් ඇසුන නිසාද?
   1. කපුටාගේ 2. ගිරවාගේ 3. කොහාගේ 4. මයිනාගේ

6. දීප්ත වස්තුවක් වන්නේ,
   1. සූර්යයාය. 2. චන්ද්‍රයාය. 3. සිකුරු ග්‍රහයාය. 4. සෙනසුරු ග්‍රහයාය.

7. 

මෙම සිදුරු කෙළින් ඇස තබා බැලූ විට ඉටිපන්දම් දැල්ල පෙනේ. එසේ වන්නේ,
   1.ආලෝකය පරාවර්තනය වන නිසාය.
   2.ආලෝකය හැරී ගමන් ගන්නා නිසාය.
   3.ආලෝකය සරල රේඛීයව ගමන් ගන්නා නිසාය.
   4.ආලෝකය විහිදෙන නිසාය.

8. ද්‍රව්‍යයකට නොමැති ගුණය වන්නේ,

1. නිශ්චිත පරිමාවක් තිබීමයි.
2. නිශ්චිත හැඩයක් තිබීමයි.
3. නිශ්චිත වර්ණයක් තිබීමයි.
4. නිශ්චිත ස්කන්ධයක් තිබීමයි.

9. සර්වසම ටින් දෙකකට සමානව ජලය දමා ඒවා පිළිවෙලින් A - කළු කොළයකින්ද B-සුදු කොළයකින්ද ආවරණය කර හොඳින් සූර්යාලෝකය වැටෙන ස්ථානයක තබා ටික වේලාවකින් නිරීක්ෂණය කරන ලදී.ඒවායේ නිරීක්ෂණ විය හැක්කේ,




1. A හි උෂ්ණත්වය වැඩි අතර B හි උෂ්ණත්වය අඩුය.
2. A හි උෂ්ණත්වය අඩු අතර B හි උෂ්ණත්වය වැඩිය.
3. A හා B හි උෂ්ණත්ව අගයන් සමානය.
4. A හා B හි උෂ්ණත්ව ගැන කිසිවක් කිව නොහැක.

10.




සර්වසම බඳුන් තුනකට කරදිය,මිරිදිය,කිවුල් දිය සමාන ප්‍රමාණ දමා අව්වේ තබන ලදී.ජලය සම්පූර්ණව සිඳීගිය පසු බැලූ විට A හි කිසිවක් නොතිබුණි. B හි ඉතා තුනී සුදු කුඩු ස්ථරයක්ද C හි ඝනකම් සුදු පැහැ කුඩු ස්ථරයක්ද දැක ගත හැකි විය. A,B හා C විය හැක්කේ පිළිවෙලින්,

1. A -කරදිය B-කිවුල්දිය C-මිරිදිය යි.
2. A -මිරිදිය B-කරදිය C-කිවුල් දිය යි.
3. A -මිරිදිය B-කිවුල් දිය C-කරදිය යි.
4. A -කිවුල් දිය B-කරදිය C-මිරිදිය යි.

11. පහත දක්වා ඇති උපකරණ පිළිවෙලින්,

1. වර්ෂාමානය, අනිලමානය, සුළං දිශා දර්ශකය වේ.
2. අනිලමානය, වර්ෂාමානය, සුළං දිශා දර්ශකය වේ
3. සුළං දිශා දර්ශකය, අනිලමානය, වර්ෂාමානය වේ.
4. වර්ෂාමානය, සුළං දිශා දර්ශකය, අනිලමානය වේ.



12. 6 ශ්‍රේණියේ සිසුන් කිහිපදෙනෙකු පත්තෑයා හා ගැඩවිලා දෙබෙදුම් සුචියක් ඇසුරෙන් වෙන් කිරීමට යොදාගත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඉන් වඩාත් සුදුසු ලක්ෂණ යුගල පිළිවෙලින් ඇත්තේ කුමන පිළිතුරේද?

1. මුඛයක් ඇත,මුඛයක් නැත.
2. බහු පාද නොවේ,බහු පාද වේ.
3. සම තෙත නොවේ, සම තෙතය.
4. පස තුළ ජීවත්වේ,පස තුළ ජීවත් නොවේ.

13. වීදුරු තහඩුවක්,රබර් පටියක්,හා ලෝහ තහඩුවක් යන ද්‍රව්‍ය කාණ්ඩය සතු ලක්ෂණයක් බැගින් අඩංගු පිළිතුර වන්නේ,
 1.හංගුර වීම, ප්‍රත්‍යාස්ථ වීම, ආහන්‍ය වීම යි.
 2. හංගුර වීම, තන්‍ය වීම, මෘදු වයනයක් වීම යි.
 3.ආහන්‍ය වීම, හංගුර වීම, ප්‍රත්‍යාස්ථ වීම යි.
 4.හංගුර වීම, ආහන්‍ය වීම, ප්‍රත්‍යාස්ථ වීම යි.

14. පරිසරයට හානි නොවන අයුරින් ආහාර පිසීම සඳහා භාවිතා කළ හැකි ශක්ති සම්පත වන්නේ,
 1. එල්.පී වායුවය. 2.භූමිතෙල් ය. 3.සූර්ය ශක්තිය ය. 4.ජෛව ස්කන්ධ ය.

15. පහත දක්වා ඇති වගන්ති අතරින් සත්‍ය වගන්ති වන්නේ,
 (a) ධ්වනි ප්‍රභව ධ්වනිය ශ්‍රවණයට යොදා ගනී.
 (b) කම්පනය වීමෙන් ධ්වනිය උපදී.
 (c) රිද්මයානුකූල ශබ්ද වලින් සංගීතය උපදී.
 1. a හා b වේ. 2. b හා c වේ. 3. a හා c වේ. 4. a, b, c තුනම වේ.

16. ඝන ,ද්‍රව,වායු යන තුනටම අයත් පදාර්ථ යුගල වන්නේ,
 1.ජලය හා ඉටි වේ. 2.පොල්තෙල් හා විනාකිරි වේ.
 3.විනාකිරි හා ජලය වේ. 4.ඉටි හා විනාකිරි වේ.

17. මෙම පාංශු පැති කඩෙහි A, B හා C ලෙස දැක්වන්නේ,




 1.වර්ෂණය, භූගත ජලය, මතුපිට ජලයයි.
 2. මතුපිට ජලය, වර්ෂණය, භූගත ජලය යි.
 3. භූගත ජලය, මතුපිට ජලය, වර්ෂණය යි
 4. වර්ෂණය, මතුපිට ජලය, වර්ෂණය යි.

18. A යනු කොළයක ඔතා එල්ලා ඇති දණ්ඩකි. එයට දණ්ඩ චුම්භකයක උත්තර ධ්‍රැවය ලං කළ විට ආකර්ෂණය වුණි. A විය හැක්කේ,




 1. යකඩ කැබැල්ලකි. 2. ඇලුමිනියම් කැබැල්ලකි.
 3. ලී කැබැල්ලකි. 4. ප්ලාස්ටික් කැබැල්ලකි.

19. භාවිතයේදී ක්ෂය වන ශක්ති ප්‍රභවයක් වන්නේ,
 1. පොසිල ඉන්ධන යි. 2. සුළඟ යි. 3. මුහුදු රළයි. 4. උදම් රළ යි.

20. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 1.ස්වභාවික ආපදා සම්පූර්ණයෙන්ම වැළැක්විය හැකිය.
 2.මිලි මීටර 200ට වඩා වැඩි වර්ෂාපතනයක් මඟින් නාය යෑම් ඇතිවිය හැකිය.
 3.අපේක්ෂිත වර්ෂාපතනය 50% ට අඩු වීම නියං තත්වයකි.
 4.ලංකාවේ සෑම තැනකටම එකම වර්ෂාපතන රටාවක් පවතී.

# II. කොටස

## පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. 6 ශ්‍රේණියේ සිසුන් ක්ෂේත්‍ර චාරිකාවකදී තම නිරික්ෂණ පත්‍රිකාවල පහත නිරීක්ෂණ සටහන් කර තිබුණි.

- තණකොළ අතර ඇවිදින විට තණකොළ පෙත්තන් එහාට මෙහාට පැන්නා.
- තණකොළ හොඳින් නිරික්ෂණය කළ විට ඔවුන් තණපත්‍ර කා දමා තිබූ අයුරු දුටුවා.
- පඳුරු වල මල් පිපිලා.සමනලුන් මල් පැණි බොන්න පොර කනවා.
- පඳුරේ නිසොල්මනේ සිටි කටුස්සෙක් දිව දික්කරලා පුංචි සමනලයෙක්ව අල්ලා ගත්තා.
- වැව් ඉවුරට ආසන්න ජලයේ ජලජ ශාක අතර පුංචි මාළුවෝ පීනනවා.
- ඉවුරේ ඇති අඹ ගසේ සිටි පිළිහුඩුවා එකපාරටම ඉගිල ඇවිත් මාළුවෙක් අල්ලා ගත්තා.
- කුඹුරේ පැසුණු ගොයම් අතරින් දිව ගිය මීයෙකුට කුරුමානම් අල්ලන ගැරඬියා හෙමින් හෙමින් ඉදිරියට ඇදෙනවා.
- ඉවුරේ ඇති අඹ ගසේ වූ ඉදුණු අඹයක් කමින් සිටි කපුටෙක් එකපාරටම ඇවිත් මීයා අල්ලාගෙන ඈතට ඉගිලුනා.

ඔවුන් මෙම ශාක හා සතුන්ගේ ආහාරමය අන්තර් ක්‍රියා පහත පරිදි ආහාර ජාලයකට ඇතුළත් කරන ලදී.




I. එම ආහාර ජාලය අධ්‍යයනය කර පහත ජීවීන් ලබාගත් ආහාරය බැගින් හිස්තැන් වල සටහන් කරන්න.

- තණකොළ → තණකොළපෙත්තා
- කටුස්සා → ........................
- මල්පැණි → ........................

(02)

II. ඔවුන් නිරික්ෂණය කළ සතුන්ගේ ආහාර චර්යා අනුව කාණ්ඩ තුනකට වෙන් කර තිබුණි. එම කාණ්ඩ වලට දිය හැකි නම් කොටුව යටින් ලියන්න.

| | | |
|---|---|---|
| තණකොළ පෙත්තා<br>මාළුවා | කටුස්සා<br>පිළිහුඩුවා | කපුටා |
| (a).............................. | (b) ........................ | (c) ........................ |

(03)

III. ඉහත ආහාර ජාලයේ නිෂ්පාදකයන් දෙදෙනෙකු ලියන්න. (01)

IV. ශාක වල ආහාර නිපදවීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක්ද? (01)

12784

V. හිරු එළිය,ජලය,හරිතප්‍රද, හැරුණු විට ඉහත ක්‍රියාවලියට වැදගත්වන අනෙක් සාධකය නම් කරන්න. (01)

VI. ගැරඬියා වෙත ශාක තුළ ගබඩා වූ ශක්තිය ගලා යන්නේ කෙසේද? (02)

VII. නිෂ්පාදකයන් හැරුන විට අනෙකුත් සතුන් හැඳින්විය හැකි පොදු නම කුමක්ද? (01)

VIII. ඉහත ආහාර ජාලයෙන් පුරුක් 3ක ආහාර දාමයක් ලියන්න. (02)

IX. ගැරඬියා විනාශ කළහොත් පරිසරයේ වැඩිවේ යැයි අපේක්ෂා කළ හැක්කේ කුමන ජීවීන්ද? (01)

X. ආහාර දාම හා ජාල අතර සම්බන්ධතාවයෙන් ඉටුවන වැදගත් පාරිසරික මෙහෙය කුමක්ද? (01)

XI. පරිසරයේ ජීවත්වන විවිධ ජීවීන් විවිධ ආහාර ගැනීමට පුරුදුවී සිටිති.යෝධ පැන්ඩා උණ පත්‍ර පමණක් ආහාරයට ගැනීමට පුරුදුවී සිටීම නිසා සිදු වී ඇති අවාසිය කුමක්ද? (01)

2. (A)පහත දක්වා ඇත්තේ 6ශ්‍රේණියේ සිසුන් සිදු කළ පරීක්ෂණ කිහියකට අදාල පින්තූර කිහිපයකි. ඒ සම්බන්ධව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. 
මෙහි බඳුන් තුනටම සමානව ජලය දමා ඇත.ඒ අනුව ජලයට නොමැති යැයි සිතිය හැකි ලක්ෂණය වන්නේ ස්ථිර ------------------------කි.

II. 
හිස් බෝතලය ජලය තුල ගිල්වා එය තරමක් ඇල කළ විට බෝතලය තුලට ජලය ගලා එන අතර බෝතලය තුළින් වායු බුබුළු පිටවිය.එසේ වූයේ බෝතලය තුළ වාතය තිබූ බැවිනි. ඉන් නිගමනය වන්නේ වාතයට --------------------------------------අවශා බවයි.

III. 

බැලුන් දෙක සමතුලිතව තබා B බැලුමෙහි කරට ආසන්නව කටුවකින් සිදුරු කරන ලදි. එවිට A බැලුනය ඇති පැත්ත පහළට ගමන් කරනු දක්නට ලැබුණි. ඉන් නිගමනය කළ හැක්කේ වාතයට -------------- ඇති බවය.

IV. 

වීදුරුව පතුලේ ලේන්සුව සිර කර එම වීදුරුව සිරස්ව ජල බඳුනේ ගිල්වා, එලෙසම ඉහළට ඔසවා බැලූවිට ලේන්සුව තෙමී නොතිබුණි. එමගින් පැහැදිලි වන්නේ .............................. ඉඩක් ගන්නා බවයි

V. 

A පෙරහන් කඩදාසිය ජල බඳුනේ ගිල්වන ලදී.එවිට A පෙරහන් කඩදාසිය ඇති පැත්ත

(a)-------------------විය.එසේ වූයේ ජලයට (b)------------------------------ ඇති බැවිනි.

(B). මෙම වගන්ති නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (X) ද ඉදිරියෙන් ඇති හිස් තැන මත යොදන්න.

I. කෘෂි රසායනික ද්‍රව්‍ය හා රසායන ද්‍රව්‍ය නිසා ජල දූෂණය සිදුවේ. (----)

II. ජල වාෂ්ප යනු වායු අවස්ථාවේ පවතින ජලයයි (----)

III. ස්වභාවයේ ජලය පවතින ආකාර වන්නේ වර්ෂණය, මතුපිට ජලය හා භූගත ජලයයි. (----)

IV. ග්ලැසියරවල ඇත්තේ ද්‍රව අවස්ථාවේ පවතින ජලයයි. (----)

V. චන්ද්‍රයා ආලෝක ප්‍රභවයකි. (----)

(05)

3. 6 ශ්‍රේණියට අදාළ බිත්ති පුවත් පතක විදුලිය සම්බන්ධ ලිපියක පහත සදහන් සංකේත සටහන් කර තිබුණි.




I. a හා b සංකේත වල නම් ලියන්න. (01)



II. මෙම පරිපථය ඔබගේ පිළිතුරු පත්‍රයෙහි ඇඳ , හිස් තැනට ආලෝක විමෝචක ඩයෝඩයක් ආලෝකය විහිදෙන අයුරින් නිවැරදිව සම්බන්ධ කරන්න.(සංකේතයෙන් දක්වන්න.)

(01)

III. ඉලෙක්ට්‍රෝනික උපාංග පිළිබඳ අධ්‍යයනයේදී LDR අඩංගු පරිපථයක් ඔබ සකසන්නට ඇත.මෙහි LDR එක ඇඟිල්ලෙන් වැසුවහොත් කුමක් සිදුවේද? (01)



IV. මෙහි දක්වා ඇත්තේ සරල කෝෂයක සටහනකි. සින්ක් හා කොපර් තහඩු තනුක සල්ෆියුරික් අම්ලය තුළ බහාලූ වහාම දැකිය හැකි නිරීක්ෂණ දෙකක්ලියන්න.




(02)

V. මෙහි තනුක සල්ෆියුරික් අම්ලය වෙනුවට භාවිතා කළ හැකි වෙනත් ද්‍රවයක් නම් කරන්න. (01)

VI. ඔබට විදුලි බුබුලු දෙකක් , සම්බන්ධක කම්බි, ස්විචයක් , වියළි කෝෂ දෙකක් සහ ඇමීටරයක් සපයා ඇත්නම් විදුලි බුබුලු දෙක ශ්‍රේණිගතව සම්බන්ධ කර, ඇමීටරයේ ධන හා සෘණ අග්‍ර නිවැරදිව දක්වමින් සම්බන්ධ කරන ලද පරිපථ සටහනක් අඳින්න. (සංකේත පමණක් භාවිතා කරන්න) (03)

VII. ඇමීටරයක් විදුලි පරිපථයකට සම්බන්ධ කරන්නේ කුමක් මැනීමටද? (01)

VIII. නිවසේදී විදුලිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීමට ඔබට ගත හැකි ක්‍රියා මාර්ගයක් ලියන්න. (01)

4. වත්ත පහළ කොස් ගස යටට ගිය කාන්ති, කුණු වෙමින් තිබූ වරකා ගෙඩියකට පයින් ගැසුවා. ඉහඳ පණුවෝ දඟලනවා. ගොළුබෙල්ලෝ,හංගොල්ලෝ,සීතලට ගුලිවෙලා. කොළ සර සර ගාන ශබ්දයට පිටුපස හැරුණු ඇයට දැකගන්න ලැබුනේ දිව එළියට දමමින් හෙමින් ඇවිදින තලගොයෙක්. කාන්තිගේ පස්වෙනි උපන්දිනයට හිටවපු අඹ ගහ දැන් එයාටත් වඩා උසයි. කකුලේ එල්ලුන කූඩැල්ලා කොළයකින් අල්ලලා විසිකරපු ඇය මදටිය ඇට ගොඩකුත් එකතු කරගෙන ගෙදර දිව්වා.

I. මෙම ඡේදයේ සිටි තලගොයා වාසස්ථාන අනුව කුමන වර්ගයකට අයත් වේද ? (01)
II. තලගොයාගේ සංචරණ ක්‍රමය කුමක්ද? (01)
III. ඉදුණු වරකා ගෙඩිය කුණු කිරීමට හේතු වන්නේ කුමන ජීවී කාන්ඩයද? (01)
IV. ඉහඳ පණුවන් ඇති වූයේ කෙසේද? (02)
V. ඉහත ඡේදයේ කියවෙන තෙතමනය සහිත පරිසරවල වාසය කරන ජීවීන් දෙදෙනෙකු ලියන්න. (02)
VI. මදටිය ඇට මඟින් සිදුකෙරෙන ක්‍රියාව කුමක්ද? (01)
VII. කූඩැල්ලාගේ භෝජන ක්‍රමය කුමක්ද? (01)
VIII. ශාක හා සතුන් අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (02)

5. තාපය හා එහි බලපෑම් පිළිබඳ සොයා බැලීමට සිසුන් කණ්ඩායම් 6ක් ක්‍රියාකාරකම් සිදු කර නිරික්ෂණ සටහන් කර ගන්නා ලදී.එම ක්‍රියාකාරකම් වලට අදාළ රූප සටහන් පහත පරිදි ඇඳ තිබුණි. එම ක්‍රියාකාරකම් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



I. 2 කණ්ඩායම සොයා බැලුවේ කුමක්ද? (01)
II. 1 කණ්ඩායම සිදුකර ඇති ක්‍රියාකාරකමට අනුව ජලයේ අවස්ථා විපර්යාසය ලියා දක්වන්න. (01)
III. 5 වන කණ්ඩායම කම්බි පුඩුව රත් කර වීදුරු බෝලය එහි තැබූවිට කුමක් නිරීක්ෂණය කළ හැකිද? (01)
IV. එමගින් එළඹිය හැකි නිගමනය කුමක්ද? (01)
V. එම සංසිද්ධිය ප්‍රායෝගිකව යොදා ඇති අවස්ථාවක් නම් කරන්න. (01)
VI. 3 කණ්ඩායම සිදුකළ ක්‍රියාකාරකමේදී වර්ණවත් ජලය බටේ දිගේ ඉහළ ගියේ ඇයි? (01)
VII. 6 වන කණ්ඩායම සිදුකළ පරීක්ෂණයේදී නික්‍රෝම් කම්බි දඟරය මත තිබූ ඉටි දිය වූයේ ඇයි? (01)
VIII. නික්‍රෝම් කම්බි දඟරයක් යොදාගෙන ඇති විදුලි උපකරණයක් නම් කරන්න. (01)
IX. 4 වන ක්‍රියාකාරකමේදී කාසිය එසවෙන්නේ ඇයි? (01)
X. පරිසරයේ උෂ්ණත්වය වෙනස්වීම අනුව තම ශරීරයේ උෂ්ණත්වය නියතව තබා ගත නොහැකි ජීවියෙකු නම් කරන්න. (01)
XI. අධිකව පොසිල ඉන්ධන දහනය කිරීමෙන් සිදුවන පාරිසරික අර්බුදයක් ලියන්න. (01)

6. කාර්යය කිරීමේ හැකියාව ශක්තිය ලෙස හඳුන්වයි.ශක්තිය භාවිතයෙන් අප නොයෙකුත් ක්‍රියා සිදුකර ගන්නෙමු. ශක්තිය ලබා දෙන මූලාශ්‍ර ශක්ති ප්‍රභව වේ. විවිධ ශක්ති ප්‍රභව පැවැතුනත් අද ලෝකය ශක්ති අර්බුදයකට මුහුණ පා ඇත. එම නිසා ශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම ලොකු කුඩා අප කාගේත් යුතුකමකි.

I. සූර්ය ශක්තිය භාවිතයෙන් ජලය රත් කර ගැනීමට හැකි ඔබ සෑදූ උපකරණයේ නම කුමක්ද? (01)
II. සූර්ය ශක්තියට අමතරව ඔබ දන්නා වෙනත් ශක්ති ප්‍රභව දෙකක් නම් කරන්න. (01)
III. කෘත්‍රිම චන්ද්‍රිකා වලට අවශ්‍ය ශක්තිය ලබා ගැනීමට භාවිතා කරන්නේ මොනවාද? (01)
IV. ජෛව ස්කන්ධ තුළ ගැබ් වන්නේ කාගේ ශක්තියද? (01)
V. ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටා ඇති ප්‍රදේශයක් නම් කරන්න. (01)
VI. ශක්ති ප්‍රභව තිරසාරව භාවිතා කළ යුත්තේ ඇයි? (01)
VII. ශක්ති අර්බුදයට ප්‍රධාන හේතුව ලෙස ඔබ දකින්නේ කුමක්ද? (01)
VIII. මූලික ශක්ති ප්‍රභවය සූර්යයා වේ.යම් ලෙසකින් සූර්යයා විනාශ වුවහොත් මුලින්ම මිය යන්නේ කුමන ජීවී කොට්ඨාසය දැයි ඔබ සිතන්නේ ද? (02)
IX. ජල විදුලි බලාගාරයකින් විදුලිය නිපදවීමේදී තල බමරය භ්‍රමණය වන්නේ කුමන ශක්තියකින් ද? (01)
X. මෑත කාලයේ ශ්‍රී ලංකාවේ ඉදි කළ තාප බලාගාරයේ යොදා ගන්නා ශක්ති ප්‍රභවය කුමක්ද? (01)

7. (A) චුම්භක හා චුම්බක වල ගුණ පිළිබඳ ඇගයීම් අවස්ථාවකදී ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියක් පහත දැක්වේ.

I. චුම්භක භාවිතයෙන් තනා ඇති උපකරණ දෙකක් නම් කරන්න. (02)
II. චුම්භක වලට ආකර්ෂණය වන ද්‍රව්‍යයක් නම් කරන්න. (01)
III. නිදහසේ එල්ලා ඇති දණ්ඩ චුම්භකයක උත්තර හා දක්ෂිණ ධ්‍රැව පිහිටන්නේ කෙසේද? (01)
IV. පහත චුම්භක ධ්‍රැව ලං කළ විට සිදුවන්නේ ආකර්ෂණයක්ද විකර්ෂණයක් දැයි දක්වන්න. (02)

(a) N — N (c) S — S
(b) N — S (d) S — N

(B) පහත දැක්වෙන්නේ කාලගුණ අනාවැකියක කොටසකි.
"උතුරු නැගෙනහිර පළාත් වලට අද සවස් කාලයේ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. ඒ සමඟම ඇතිවන තද සුළං නිසා මුහුද රළු වේ. මුහුදු යාමෙන් වළකින ලෙස ධීවරයින්ට උපදෙස් දෙනු ලැබේ."

I. කාලගුණය යනු කුමක්ද? (02)
II. වර්ෂාපතනය මනිනු ලබන ඒකකය කුමක්ද? (01)
III. කාලගුණය වෙනස් වීම නිසා සිදුවන ස්වාභාවික ආපදා වක් නම් කරන්න. (01)
IV. මිනිසාගෙන් පරිසරයට සිදුවන බලපෑම් ද විපත් වලට හේතුවේ. නායයාම එවැනි විපතකි. නායයාම සඳහා බලපාන මිනිස් ක්‍රියාකාරකමක් ලියන්න. (01)

***